# මුදල් අමාත්‍යාංශය

## විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) ලේකම් කාර්යාලය

## කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

මුදල් අමාත්‍යාංශය යටතේ e-GP ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ලේකම් කාර්යාලයේ (e-GP ලේකම් කාර්යාලය) පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් පළපුරුදු අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - තනතුරු 01

**මාසික වේතනය (සියලු දීමනා සහිතව) :** රු. 84,000/-

**වයස් සීමාව :** අවුරුදු 64 ට අඩු

**සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක්

හෝ

අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකම්. හෝ

අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සාමාජිකත්වයක් / සමාන වෘත්තීය සුදුසුකමක් සමග

අවම වශයෙන් අවුරුදු 07 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම හා ඉන් වසර 3 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වීම හෝ

02. අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් රජයේ දිප ව්‍යාප්ත සේවයේ හෝ ඊට සමාන සේවයක 1 වන ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර 02 ක පළපුරුද්ද

ව්‍යාපෘති කළමනාකරණය, රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ මනා දැනුමක් ඇති සහ දේශීය / විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කටයුතු කිරීමේ පළපුරුද්ද ඇති අපේක්ෂකයින්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

### 02. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී - තනතුරු 01

**මාසික වැටුප (සියලු දීමනා ඇතුළත්ව) :** රු. 40,000/-

**වයස් සීමාව :** අවුරුදු 50 ට අඩු

**සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධියක් හෝ ඊට සමාන උපාධියක්. හෝ

අදාළ විෂය ක්ෂේත්‍රය සඳහා උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකම්

LAMP වෙබ් පාදක මෘදුකාංග සංවර්ධනය පිළිබඳ අත්දැකීම් ඇති, පරිශීලක අතුරුමුහුණත් නිර්මාණය (User-Interface Design) පිළිබඳ මනා දැනුමක් ඇති, AGILE යටතේ පද්ධති පරීක්ෂාව (System Testing) සහ ලේඛනකරණයට හැකියාව තිබීම අමතර සුදුසුකම් වනු ඇත.

### 03. ව්‍යාපෘති නිලධාරී (ධාරිතා වර්ධනය) - තනතුරු 03

**මාසික වැටුප (සියලු දීමනා සහිතව) :** රු. 40,000/-

**වයස් සීමාව :** අවුරුදු 50 ට අඩු

**සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සාර්ථකව සම්පූර්ණ කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධියක් හෝ ඊට සමාන උපාධියක්. හෝ

අදාළ විෂය ක්ෂේත්‍රය සඳහා උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකමක්. සමග

අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 02 ක පළපුරුද්ද හෝ

අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් වෘත්තීය සුදුසුකමක් සමග

අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 02 ක පළපුරුද්ද.

තොරතුරු තාක්ෂණය, ප්‍රසම්පාදන / කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ අත්දැකීම් ඇති සහ පිරිස ඉදිරියේ කතා පැවැත්වීම (Public speaking) / ඉගැන්වීම පිළිබඳ පළපුරුද්දක් ඇති අපේක්ෂකයින්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

**සේවයට බඳවා ගැනීමේ පදනම :**

මූලදී වසර 1 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදනම මත

**නියමයන් සහ කොන්දේසි :**

සියලුම පත්වීම් මුලින් වසර 01 ක කාලයක් සඳහා පත් කෙරෙන අතර, සේවා කාලය දීර්ඝ කිරීම කාර්ය සාධනය මත පදනම් වේ. 2019.03.15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ පසුව ඇති චක්‍රලේඛවල ඇති සියලුම කොන්දේසි මෙම පත්වීම් සඳහා අදාළ වේ.

අපේක්ෂකයාගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා පළපුරුද්ද සහ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඇතුළත් ජීව දත්ත පත්‍රිකාවක් 2021 ජූලි 05 දිනට හෝ ඊට පෙර පහත දක්වෙන **ඊමේල් ලිපිනයට පමණක් එවිය යුතුය.**

**egphr@promise.lk**

අයදුම් කරන තනතුර අදාළ විද්‍යුත් ලිපියේ මාතෘකාවේ පැහැදිළිව සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ**
**e-GP ලේකම් කාර්යාලය,**
**2 වන මහල, නව ගොඩනැගිල්ල,**
**මුදල් අමාත්‍යාංශය.**

22.06.2021